## අධ්‍යාපන අමාත්‍යාංශයේ (උසස් අධ්‍යාපන අංශයෙහි) ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ දෙපාර්තමේන්තුගත කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා වන උසස් කිරීමේ පරිපාටිය

1 සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : අදාළ නොවේ යොමු අංකය - දිනය -

1.2 අමාත්‍යාංශය : අධ්‍යාපන යොමු අංකය - HE/EST/NODES/PMT-2014/1 දිනය - 2020.09.28

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම : යොමු අංකය -DMS/7777/NODES දිනය - 2017.08.01/2020.07.30

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය: යොමු අංකය - EST-2/04/REC/7914 දිනය - 2019.10.18

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය: යොමු අංකය - NSCC/05/43/SR දිනය - 2019.06.27

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතිය: යොමු අංකය - PSC/EST/08-01-08/01/2020 දිනය - 2020.09.10

2 පත් කිරීම් බලධරයා - රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්

3 සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : ප්‍රාථමික - ශිල්පීය නොවන

3.2 ශ්‍රේණි : III ,II, I සහ විශේෂ

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයන්හි කාර්යයන් ඉටුකිරීම හා පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන පොදු මූලික අවශ්‍යතාවයන් අතුරින් නිශ්චිත අර්ධ ශිල්පීය හෝ ශිල්පීය නිපුණතාවයකින් තොරව ඉටු කළ හැකි මූලික කාර්යයන් පවරනු ලබන බහුකාර්ය සේවා ගණයක් ලෙස මෙම සේවා සේවා ගණය සැලකේ. මෙම කාර්ය පථයනට අයත් කාර්ය අතුරින් ඕනෑම කාර්යභාරයක් දෙපාර්තමේන්තු ප්‍රධාන / පත්කිරීම් බලධරයා විසින් මෙම සේවා ගණයට අයත් නිලධරයෙකුට පවරනු ලැබිය හැක.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

4 තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය - ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

5 වැටුප්

5.1 වැටුප් කේත අංකය : PL 1 - 2016

5.2 වැටුප් පරිමාණය: රු.24,250-10x250-10x270-10x300-12x330- රු. 36,410/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | රු 24,250/- |
| II | පියවර 12 | රු 27,020/- |
| I | පියවර 22 | රු 29,750/- |
| විශේෂ ශ්‍රේණිය | පියවර 32 | රු 32,780/- |

6 සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| කාර්යාල කාර්ය සහායක | III / II / I හා විශේෂ | 02 | අධ්‍යාපන අමාත්‍යාංශයේ (උසස් අධ්‍යාපන අංශයෙහි) ලිපිගොනු එහා මෙහා ගෙනයාම, කාර්යාලය හා අවට පරිසරය මනා තත්වයෙන් පවත්වාගෙන යාම |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 02

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම සඳහා III, II, I හා විශේෂ ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

7. බඳවා ගැනීමේ ක්‍රමය : මෙම තනතුර දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇති බැවින් බඳවා ගැනීමේ ක්‍රමය අදාළ නොවේ.

8 කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් (03) ගතවීමට පෙර | වාචික පරීක්ෂණයකි ඇමුණුම 01 |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස් වී වසර තුනක් (03) ගතවීමට පෙර | වාචික පරීක්ෂණයකි ඇමුණුම 02 |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස් වී වසර පහක් (05) ගතවීමට පෙර | වාචික පරීක්ෂණයකි ඇමුණුම 03 |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද - වසරකට දෙවතාවක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද -

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

09 භාෂා ප්‍රවීණතාවය

9.1.

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01 රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබාගත යුතුය |
| 02 අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය. |

10 ශ්‍රේණි උසස් කිරීම්:

10.1 III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

(i) පත්වීම ස්ථිර කර තිබීම.

(ii) සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10)ක් උපයාගෙන තිබීම.

(iii) අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඩුවමක් ලබා නොතිබිය යුතු ය.

(v) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

(vi) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2. II ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඩුවමක් ලබා නොතිබිය යුතු ය.

(ii) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iii) අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.3. I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

10.3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.3.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

(i) සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09)ක් උපයාගෙන තිබීම

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

(iii+) අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.3.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

සංලක්ෂය :

සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11 තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ.

12 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි : අදාළ නොවේ.

13 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ

සක්‍රීය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුළත් නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14 ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : අදාල නොවේ.

15 සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16 මෙම උසස් කිරීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17 අන්තර්කාලීන විධිවිධාන :අදාළ නොවේ

සකස් කළේ

අත්සන

නම : ඒ.ජේ.සී.කේ. බණ්ඩාර

තනතුර : පරිපාලන නිලධාරි

දිනය : 2020.09. 28

ඒ.ජේ.සී.කේ. බණ්ඩාර
පරිපාලන නිලධාරි
අධ්‍යාපන අමාත්‍යාංශය
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07

පරීක්ෂා කළේ

අත්සන

නම : එම්.ඒ.අයි.කේ. මන්ත්‍රීරත්න

තනතුර : ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

දිනය : 2020.09. 30

එම්.ඒ.අයි.කේ. මන්ත්‍රීරත්න
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

තනතුර

නිල මුද්‍රාව

දිනය 2020.09.30

ටී.බී.එම්. අතපත්තු
අතිරේක ලේකම් (පාලන හා මුදල්)
අධ්‍යාපන අමාත්‍යාංශය
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07

යොමු අංකය

අධ්‍යාපන අමාත්‍යාංශයේ (උසස් අධ්‍යාපන අංශයෙහි) ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ දෙපාර්තමේන්තුගත කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා වන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මෙම උසස් කිරීමේ පටිපාටිය සහතික කිරීම නිර්දේශ කරමි.

අත්සන 02/10/2020

නම

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

නිල මුද්‍රාව

මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07

---

යොමු අංකය: PSC/EST/08-01-08/01/2020

අධ්‍යාපන අමාත්‍යාංශයේ (උසස් අධ්‍යාපන අංශයෙහි) ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ දෙපාර්තමේන්තුගත කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා වන උසස් කිරීමේ පටිපාටිය 2020.09.10 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන

නම එම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නිල මුද්‍රාව

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

2020-10-20

ඇමුණුම 01

**අධ්‍යාපන අමාත්‍යාංශයේ (උසස් අධ්‍යාපන අංශයෙහි) ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ දෙපාර්තමේන්තුගත කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා වන III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය පිළිබඳ ආකෘතිය**

01 විභාගයේ නම - අධ්‍යාපන අමාත්‍යාංශයේ (උසස් අධ්‍යාපන අංශයෙහි) ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ දෙපාර්තමේන්තුගත කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා වන III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02 විභාගය පිළිබඳ විස්තර - වාචික පරීක්ෂණයකි.

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| සේවකයා උසස් අධ්‍යාපන අංශයට පැවරෙන කාර්යයන් පිළිබඳව අවශ්‍ය වන පරිදි දැනුම ලබා ඇත්දැයි මැන බැලීම | 30 | 10 |
| සාමාන්‍ය කාර්යාල ක්‍රම හා ආයතනික පරිපාලන ක්‍රමවේදයන් පිළිබඳව තම සේවයට අදාළ දැනුම | 30 | 10 |
| තනතුරට පැවරෙන විවිධ කාර්යයන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා ප්‍රවීණතාවක් අත්පත් කරගෙන ඇත්දැයි මැන බැලීම | 40 | 20 |
| එකතුව | 100 | 40% |

03 පවත්වනු ලබන බලධරයා : අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

04 පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමකට වරක්ද යන වග - වසරකට දෙවරක්

සටහන : කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලදී සියලුම විෂයයන් එකවර සමත්විය යුතුය.

සකස් කළේ
අත්සන
නම : ජේ.ජේ.සී.කේ. බණ්ඩාර
තනතුර : පරිපාලන නිලධාරි
දිනය : 2020.09. 29

ජේ.ජේ.සී.කේ. බණ්ඩාර
පරිපාලන නිලධාරි
අධ්‍යාපන අමාත්‍යාංශය
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07

පරීක්ෂා කළේ
අත්සන
නම : එම්.ජී.අයි.කේ. මන්ත්‍රීරත්න
තනතුර : ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
දිනය : 2020.09. 30

එම්.ජී.අයි.කේ. මන්ත්‍රීරත්න
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07

අත්සන
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම
තනතුර
දිනය 2020.09.30
නිල මුද්‍රාව ඒ.බී.එම්. අතපත්තු
අතිරේක ලේකම් (පාලන හා මුදල්)
අධ්‍යාපන අමාත්‍යාංශය
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07

ඇමුණුම 02

**අධ්‍යාපන අමාත්‍යාංශයේ (උසස් අධ්‍යාපන අංශයෙහි) ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ දෙපාර්තමේන්තුගත කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා වන II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය පිළිබඳ ආකෘතිය**

01 විභාගයේ නම - අධ්‍යාපන අමාත්‍යාංශයේ (උසස් අධ්‍යාපන අංශයෙහි) ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ දෙපාර්තමේන්තුගත කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා වන II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02 විභාගය පිළිබඳ විස්තර - වාචික පරීක්ෂණයකි.

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී ආවරණය වූ විෂයන්ට අදාළව ගතවූ සේවා කාලය තුළ අදාළ ක්ෂේත්‍රය තුළ සිදුවී ඇති පරිපාටිමය, නීතිමය සංශෝධනයන් වැනි වෙනස්වීම් පිළිබඳ සේවකයාගේ දැනුම සහ ඔහුගේ කාර්යයට අදාළ නව්‍යකරණයන් පිළිබඳ සේවකයාගේ කුසලතා පිළිබඳ මැන බැලීම. | 100 | 40 |
| එකතුව | 100 | 40% |

03 පවත්වනු ලබන බලධරයා : අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

04 පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමකට වරක්ද යන වග - වසරකට දෙවරක්

සකස් කළේ
අත්සන
නම : ඒ.ජේ.සී.කේ. බණ්ඩාර
තනතුර : පරිපාලන නිලධාරී
දිනය : 2020.09. 28

ඒ.ජේ.සී.කේ. බණ්ඩාර
පරිපාලන නිලධාරී
අධ්‍යාපන අමාත්‍යාංශය
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07

පරීක්ෂා කළේ
අත්සන
නම : එම්.ඒ.අයි.කේ. මන්ත්‍රීරත්න
තනතුර : ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
දිනය : 2020.09. 30

එම්.ඒ.අයි.කේ. මන්ත්‍රීරත්න
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07

අත්සන
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම
තනතුර
දිනය 2020-09-30
නිල මුද්‍රාව ටී.බී.එම්. අතපත්තු
අතිරේක ලේකම් (පාලන හා මුදල්)
අධ්‍යාපන අමාත්‍යාංශය
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07

ඇමුණුම 03

**අධ්‍යාපන අමාත්‍යාංශයේ (උසස් අධ්‍යාපන අංශයෙහි) ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ දෙපාර්තමේන්තුගත කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා වන I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය පිළිබඳ ආකෘතිය**

01 විභාගයේ නම - අධ්‍යාපන අමාත්‍යාංශයේ (උසස් අධ්‍යාපන අංශයෙහි) ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ දෙපාර්තමේන්තුගත කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා වන I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02 විභාගය පිළිබඳ විස්තර - වාචික පරීක්ෂණයකි.

| විෂය ක්ෂේත්‍රය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| පළමුවැනි හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේදී ආවරණය වූ විෂයන්ට අදාළව ගතවූ සේවා කාලය තුළ අදාළ ක්ෂේත්‍රය තුළ සිදුවී ඇති පරිපාටිමය, නීතිමය සංශෝධනයන් වැනි වෙනස්වීම් පිළිබඳ සේවකයාගේ දැනුම සහ ඔහුගේ කාර්යයට අදාළ නව්‍යකරණයන් පිළිබඳ සේවකයාගේ කුසලතා පිළිබඳ මැන බැලීම. | 100 | 40 |
| එකතුව | 100 | 40% |

03 විභාගය පවත්වනු ලබන බලධරයා : අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

04 විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග - වසරකට දෙවරක්

සකස් කළේ
අත්සන
නම : ඒ.ජේ.සී.කේ. බණ්ඩාර
තනතුර : පරිපාලන නිලධාරී
දිනය : 2020.09. 28

ඒ.ජේ.සී.කේ. බණ්ඩාර
පරිපාලන නිලධාරී
අධ්‍යාපන අමාත්‍යාංශය
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07

පරීක්ෂා කළේ
අත්සන
නම : එම්.ඒ.අයි.කේ. මන්ත්‍රීරත්න
තනතුර : ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
දිනය : 2020.09. 30

එම්.ඒ.අයි.කේ. මන්ත්‍රීරත්න
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07

අත්සන
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම
තනතුර
දිනය 2020.09.30
නිල මුද්‍රාව

ටී.බී.එම්. අතපත්තු
අතිරේක ලේකම් (පාලන හා මුදල්)
අධ්‍යාපන අමාත්‍යාංශය
අංක 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07